# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2022**
**2024 ඔක්තෝබර් / නොවැම්බර්**

**සමාජීය විද්‍යා පීඨය**

## ආර්ථිකවිද්‍යාව

**ආර්ථිකවිද්‍යා මූලධර්ම - ECON 18214**

කැමති ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. අ) ආර්ථිකවිද්‍යාව විෂයයෙහි කාර්යභාරය කුමක් ද යන්න එහි විකාශය පදනම් කරගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

ආ) 'ආර්ථිකවිද්‍යා යනු මිහිපිට ඇති සම්පත්වලින් අසීමිත වූ මිනිස් අවශ්‍යතාවන් සපුරා ගැනීමට කරනු ලබන උත්සාහයන් පිළිබඳ සලකා බලන විද්‍යාවකි.' මෙම ප්‍රකාශය පිළිබඳ ඔබගේ අදහස් දක්වන්න. (ලකුණු 10)

02. අ) යථානුරූපී ආර්ථිකවිද්‍යා සහ අභිමතානුරූපී ආර්ථිකවිද්‍යා විග්‍රහ අතර පවත්නා වෙනස ප්‍රායෝගික නිදසුන් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

ආ) 'හිඟකම' සහ 'තේරීම' යන්නෙන් කුමක් අදහස් කරන්නේද? (ලකුණු 06)

ඉ) අර්ථ ක්‍රමයක කාර්යක්ෂම නිමැවුම තෝරා ගනු ලබන්නේ කෙසේද යන්න නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර රූපසටහනක් ආශ්‍රයෙන් පෙන්වන්න. (ලකුණු 06)

03. අ) ආර්ථිකයක ඇගයීමට ලක් කරනු ලබන කරුණු මොනවාද යන්නත්, ආර්ථික අරමුණු කෙතෙක්දුරට ඉෂ්ටව ඇතිද යන්නත්, සොයා බැලීම සඳහා කුමන කරුණු කෙරෙහි අවධානය යොමු කරන්නේ ද? පැහැදිලි කරන්න. (ලකුණු 10)

ආ) අර්ථක්‍රමයක් තුළ මූලික ආර්ථික ගැටලු විසඳාගැනීමේ දී ආර්ථික පද්ධති අතර පවත්නා මූලික වෙනස්කම් මොනවා දැයි කෙටියෙන් දක්වන්න. (ලකුණු 10)

04. පහත ලේඛනයේ දක්වා ඇත්තේ X භාණ්ඩය සඳහා වෙළෙඳපොල තොරතුරු වේ. (මිල (P) රුපියල් මගින් හා ප්‍රමාණය (Q) කිලෝ ග්‍රෑම් දහස් ගණනින්)

| P | Qd | Qs |
|---|---|---|
| 25 | 200 | 40 |
| 30 | 180 | 70 |
| 35 | 160 | 100 |
| 40 | 140 | 130 |
| 45 | 120 | 160 |
| 50 | 100 | 190 |

ඉහත තොරතුරු භාවිතයෙන්

අ) i. ඉල්ලුම් හා සැපයුම් සමීකරණ ගොඩනගන්න. (ලකුණු 02)

ii. වෙළෙඳපොල සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 02)

iii. පාරිභෝගික අතිරික්තය හා නිෂ්පාදක අතිරික්තය ගණනය කරන්න. (ලකුණු 02)

ආ) i. මෙම භාණ්ඩය සඳහා ඒකකයක් මත රුපියල් 5 ක අලෙවි බද්දක් පනවන්නේ නම්, නව වෙළෙඳපොල සමතුලිතය සොයන්න. (ලකුණු 02)

ii. පාරිභෝගිකයා හා නිෂ්පාදකයා අතර බදු බර බෙදී යන්නේ කෙසේදැයි සොයන්න. (ලකුණු 02)

ඉ) i. මෙම භාණ්ඩය රුපියල් 25 ක මිලකට ආනයනය කරන්නේ නම්, ආනයන වියදම කොපමණද? (ලකුණු 02)

ii. මෙම භාණ්ඩයට ඒකකයක් මත රුපියල් 2 ක ආනයන තීරු බද්දක් පනවන්නේ නම්, ආනයන තීරු බදු ආදායම ගණනය කරන්න. (ලකුණු 02)

ඊ) වෙළෙඳපොල භාණ්ඩ මත අය කෙරෙන අලෙවි බද්දක සහ ආනයන තීරු බද්දක හා අපනයන තීරු බද්දක ආර්ථික ප්‍රතිවිපාක අතර ඇති වෙනස නිදසුන් ආශ්‍රයෙන් පහදන්න. (ලකුණු 06)

05. අ) නිෂ්පාදන න්‍යායේ කෙටි කාලය තුළ වැඩෙන ඵල ස්ථාවර ඵල හා හීනවන ඵල වෙන් වෙන්ව හඳුනාගන්නා ආකාරය උචිත සටහනක් ඇසුරින් පෙන්වන්න. (ලකුණු 05)

ආ) නූතන පිරිවැය න්‍යාය තුළ ස්ථාවර පරිමැසුම් නිමැවුම (Constant returns to scale) යනුවෙන් කුමක් අදහස් කරන්නේද? (ලකුණු 05)

ඉ) හීනවන ආන්තික උපයෝගිතා සංකල්පය තුළින් පෞද්ගලික භාණ්ඩ හා පොදු භාණ්ඩ පරිභෝජන සමතුලිතය තීරණය කෙරෙන ආකාර උචිත සටහනක් ඇසුරින් පහදන්න. (ලකුණු 05)

ඊ) සාමාන්‍ය අයභාර වක්‍රය හා සාමාන්‍ය පිරිවැය වක්‍රය අතරත් ආන්තික අයභාර වක්‍රය හා ආන්තික පිරිවැය වක්‍රය අතරත් පවතිනුයේ කුමන සම්බන්ධයක් ද? (ලකුණු 05)

06. අ) ගණකාධිකාරී පිරිවැය සහ ආර්ථික පිරිවැය අතර වෙනස පහදන්න. (ලකුණු 04)

ආ) පූර්ණ තරඟකාරී වෙළෙඳපොල සහ ඒකාධිකාරී වෙළෙඳපොල අතර මූලික වෙනස්කම් මොනවාද? (ලකුණු 04)

ඉ) පූර්ණ තරඟකාරී වෙළෙඳපොල නිෂ්පාදකයකු අවප්‍රමාණික ලාභ සහ අතිප්‍රමාණික ලාභ උපයා සමතුලිතයට පත්වන ආකාර රූප සටහන් මගින් පෙන්වා දෙන්න. (ලකුණු 06)

ඊ) ඒකාධිකාරී වෙළෙඳපොල සමතුලිතය යටතේ සමාජ සුබසාධන හානිය පිළිබඳ විග්‍රහ කරන්න. (ලකුණු 06)

07. අ) ජාතික ගිණුම් යනු කුමක් ද යන්න පහදා, එහි කාර්යභාරය කුමක් ද යන්න නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 06)

ආ) විවෘත ආර්ථිකයක ජාතික ආදායම් චක්‍රීය ප්‍රවාහයේ විදීම් සහ කාන්දුවීම් යනු මොනවා ද යන්න සටහනක් ඇසුරින් පෙන්වන්න. (ලකුණු 06)

ඉ) ජාතික ගිණුම්කරණයේ දී මුහුණදෙන සංරෝධක මොනවාද ද යන්න හා ඒවා අවමකරගත හැකි ආකාර නිදසුන් ඇසුරින් පහදන්න. (ලකුණු 08)

08. අ) ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය කුමක් ද යන්න සඳහන් කරන්න. (ලකුණු 07)

ආ) මූල්‍ය අතරමැදිකරණය යනුවෙන් කුමක් අදහස් කරන්නේද? (ලකුණු 05)

ඉ) වාණිජ බැංකු මුදල් මවන ආකාරය කල්පිත නිදසුනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

09. "ශ්‍රී ලංකාව වර්තමානයේ මුහුණ දෙන ආර්ථික අර්බුදය දිගු කාලීන මානව ක්‍රියාකාරකම් තුළින් ඇති කෙරෙන ලද්දකි." මෙම ප්‍රකාශය පිළිබඳ සාර්ව ආර්ථික විග්‍රහයක් කරන්න. (ලකුණු 20)

10. පහත ඒවා අතුරින් හතරකට (04) කෙටි සටහන් ලියන්න.

i. ආදායම් ඉල්ලුම් නම්‍යතාව ගණනයේ ඇති ප්‍රයෝජන
ii. වෙළෙඳපොල ආර්ථිකයක රජයේ කාර්යභාරය
iii. ආර්ථික පිරිමැසුම් සහ ආර්ථික නොපිරිමැසුම්
iv. භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර
v. අධිබල මුදල්
vi. ආර්ථික බද්ධ කුලිය සහ සංක්‍රාම ඉපැයුම් (ලකුණු 05 බැගින්)

**********************************